## බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2010.03.25

වේලාව : පෙ.ව.10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ජී.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ජී.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 07. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**සහභාගී නොවූවෝ :-**

| | |
|---|---|
| 01. ගරු උපසභාපති | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර | ලේකම් |

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන මහ සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා හා ලේකම් මහතා මහතා සාදරයෙන් පිළිගන්නා බව ප්‍රථමයෙන්ම පැවසීය.

ගරු සභාපතිතුමා කථාකරමින් , අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ශ්‍රී ලංකාව සෞභාග්‍යමත් දේශයක් බවට පත්කිරීමට බලය ලබා දී ඇති බැවින් , මෙරටට ගැලපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර අප රට ආසියාවේ ආශ්චර්යමත් දේශය බවට පත්කිරීම සඳහා අවශ්‍ය ශක්තිය ලබාදීම සිදුකල යුතු බව පැවසීය. එබැවින් නුදුරු දිනකදී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මහා මැතිවරණයේ දී 2/3 ක බලයක් ලබාදීමට ඇපකැප වී ක්‍රියාකිරීම අපගේ යුතුකම බව අවධාරණය කරන ලදී. මෙවර බළන්ගොඩ ආසනයෙන් අපේක්ෂකයින් දෙදෙනෙකුම ඉදිරිපත්ව ඇති බැවින් , 33 වසරකට පසුව බළන්ගොඩ ආසනයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලබාගැනීමේ සිහිනය සැබෑවනු ඇති බවද , ඒ සඳහා ඔවුන් හට ශක්ති ධෛර්ය ලැබේවා යි තමන් සුභ ප්‍රාර්ථනය කරන අතර එක්සත් ජනතා නිදහස් සංධානයට අතිවිශිෂ්ඨ ජයක් ලැබේවා ප්‍රාර්ථනය කරමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**(03) 2010.02.23 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සහා සම්මත කිරීම**

2010.02.23 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

**(04) පසුගිය සභා වාර්තාව සමාලෝචනය කිරීම**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

**05:01 බළන්ගොඩ නගර සභාව වෙත පරිත්‍යාග කරනු ලබන ගිනි නිවන රථය සඳහා අයකරනු ලබන ආනයනික බලපත්‍ර ගාස්තු හා තීරු බදු හා වැට් බදු වලින් බළන්ගොඩ සිංහ සමාජය නිදහස් කිරීම**

ඉහත සඳහන් කරුණට අදාලව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම සභාව විසින් කරන ලද ඉල්ලීමකට අනුව ජපානයේ සිංහ සමාජයක් වන 337 FUKUOKA Genkai Lions Club මගින් බළන්ගොඩ නගර සභාවට පරිත්‍යාග කිරීම සඳහා ගිනි නිවන රථයක් බළන්ගොඩ සිංහ සමාජය වෙත ලබාදීමට කටයුතු කරමින් පවතී. මෙම ගිනි නිවන රථය ආනයනය කිරීමේ දී තීරු බදු හා බලපත්‍ර ගාස්තු , භාණ්ඩ හා සේවා බදු ගෙවීමට කටයුතු කරන ලෙස බළන්ගොඩ සිංහ සමාජය වෙත දන්වා ඇති අතර , මෙම නගර සභාවට ද අදාල මුදල ගෙවීමට මුල්‍යමය හැකියාවක් නොමැති. මෙම වාහනය පොදු මහජන සේවා සඳහා යෙදවීමට ලබාදෙන්නක් බැවින් මෙයින් ආදායම් ඉපයීමක් හෝ වෙනත් ලාභ නොලැබෙන බැවින් මේ පිළිබඳව සුවිශේෂී අවධානය යොමුකර මෙම වාහනය ආනනය කිරීමේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අයකරනු බදු මුදලින් බළන්ගොඩ සිංහ සමාජය නිදහස් කරන ලෙස මුදල් අමාත්‍යාංශය වෙත දැන්වීමක් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව , මෙම ගිනි නිවන රථයට අයකරනු ලබන තීරු බදු , බලපත්‍ර ගාස්තු හා භාණ්ඩ හා සේවා බදු වලින් බළන්ගොඩ සිංහ සමාජය නිදහස් කිරීමට කටයුතු කරන ලෙස මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කිරීමට තීරණය කරන ලදී. එමෙන්ම මෙය පමණක් නොව පළාත් පාලන ආයතන වලට පොදු කාර්යයන් සඳහා පරිත්‍යාග වශයෙන් ලැබෙන ගලි බවුසර් , කසල ප්‍රවාහනය කරන ට්‍රක් රථ , කාණු පවිත්‍ර කරන පීඩන යන්ත්‍ර , ගිනි නිවන රථ හා යන්ත්‍ර සූත්‍ර යන සියල්ලක් පොදුවේ සියළු බදු වලින් නිදහස් කිරීම සුදුසු බවට තීරණය කළ අතර , එය මුදල් අමාත්‍යාංශයේ අවධානයට යොමු කළ යුතු බවට යෝජනා සම්මත විය.

**05:02 ආදායම් පරිපාලක තනතුරේ වැඩ ආවරණය කිරීම**

මෙම නගර සභාවේ ආදායම් පරිපාලක වශයෙන් සේවය කරනු ලබන ඩබ්.ආර්.කුලරත්න මහතා වයස අවුරුදු 60 සම්පූර්ණවීමෙන් 2010 අප්‍රේල් මස 14 වන දින විශ්‍රාම යැමට නියමිත ඇති බැවින් , ආදායම් අංශයෙන් රාජකාරී කටයුතු හා ආදායම් එකතු කිරීම සම්බන්ධව ගැටළුවක් මතුවන බැවින් , කාර්යාලයේ දැනට පළපුරුදු සේවක මහතෙකු මේ සඳහා යෙදවීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

කාර්යාල කාර්ය සහයක එම්.ජී.ප්‍රේමදාස මහතා නිත්‍ය තනතුරේ රාජකාරී වලින් නිදහස් කර ආදායම් පරිපාලක තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා යෙදවීමට සභාව තීරණය කරන ලදී.

05:03 **කාබනික පොහොර වල තත්ත්වය පරීක්ෂා කිරීම:**

බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයට අනුබද්ධව තත්ව පරීක්ෂන රසායනාගාරයක් ඇතිකිරීම සඳහා අත්‍යාවශ්‍ය පහත සඳහන් උපකරණ මිළදීගෙන ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර 2010.03.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

01. File වල උෂ්ණත්වය මැනීම සඳහා Digital උෂ්ණත්වමානයක්
02. පොහොර වල තෙතමනය මැනීම සඳහා Moisture Moisture meter 01
03. PH Meter 01

ඉල්ලා ඇති උපකරණයන් ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:04 **නගර සභා සේවකයන්ගේ බෝනොවන රෝග හඳුනාගැනීම ප්‍රථමාධාර උපකරණ ලබාගැනීම**

බැංකියවත්ත සේවකයින්ගේ හා කාර්යාල සේවකයන්ගේ බෝනොවෙන රෝග කලින් හඳුනාගැනීම සඳහා පහත සඳහන් උපකරණ ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කරඇති ලිපියක් සභාගත කරන ලදී.

01. රුධිරගත සීනී හඳුනාගැනීම සඳහාGluco Meter 01 ක් ලබාගැනීම
02. ක්ලෙස්ටරෝල් පරීක්ෂණය සිදුකිරීම
03. Digital PresureMeter 01
04. මාස 03 කට වරක් සුවනාරී සානයනට යොමුකිරීම
05. අවශ්‍ය ප්‍රථමාධාර උපකරණ ලබාදීම.

මෙම උපකරණ මිළදී ගැනීමට විශාල මුදලක් වැයවන බැවින් බළන්ගොඩ මූළික රෝහලට යොමු කර අවශ්‍ය ප්‍රතිකාරයන් ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:05 **ගලි බවුසරයේ සේවය ලබාගැනීම:**

බළන්ගොඩ ශාන්ත ජෝශප් වැඩිහිටි නිවාසයේ වැසිකිලි වල පිරී ඇති බැවින් , එය හිස්කිරීමට මෙම සභාව සතු ගලි බවුසරය ලබාදෙන ලෙස ඉල්ලා එම වැඩිහිටි නිවාසය භාරකරු විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

වැඩිහිටියන් වෙනුවෙන් කල යුතු වු ප්‍රජා සත්කාර්යක් බැවින් , නොමිලයේ මෙම සේවාව ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:06 **පළාත් පාලන ආයතන වලට අයත් සියළුම ගොඩනැගිලි හා නාම පුවරු වල දර්ශනීය ස්වරූපය විධිමත් කිරීම:**

උක්ත කරුණ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2010.03.18 දිනැති ලිපිය අනුව , බළන්ගොඩ නගර බල ප්‍රදේශයේ පහත සඳහන් ස්ථාන වල නාම පුවරු සවිකිරීම සුදුසු බව දන්වමින් , ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

- ඕළුගන්තොට , ඇල්ලෙපොල හා බෝම්බුව සුසාන භූමි වල නාම පුවරු
- ඕළුගන්තොට වැවේවත්ත ප්‍රජාශාලාවන් හා වැවේවත්ත පෙරපාසැල හි නාම පුවරු
- පොදු වෙළඳසැල නාම පුවරුව
- බළන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ නාම පුවරුව
- බෝම්බුව ක්‍රීඩාංගනයේ නාම පුවරුව
- බස්නැවතුම්පල සහිත වෙළඳ සංකීර්ණයේ නාම පුවරුව

ඉහත සඳහන් ස්ථානයන්හි විධිමත් ආකාරයට නාම පුවරු සවිකිරීමට තීරණය කරනලදී.

05:06 **පොදු කටයුතු සඳහා වෙන්කර දී ඇති බිම් කොටස ලබාගැනීම:**

බළන්ගොඩ , දෙහිගස්තලාව , ලංකාබරණ වත්තේ ඉඩම් කොටස්කර විකිණීමේ දී ඒ.ටී.පී.පෙරේරා බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක: 2649 දරණ ප්ලෑන ප්‍රකාර පොදු කටයුතු සඳහා වෙන්කර ඇති පර්චස් 19 ක් විශාල ලොට් අංක:07 දරණ බිම් කොටස තුළ , ලක්සිරි උයන ගමේ පදිංචිකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රජා ශාලාවක් ඉදිකිරීම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල අවසරය ලබාදෙන ලෙස ඉල්ලා ලක්සිරි උයන ග්‍රාම සංවර්ධන සහ සුභසාධක සමිතියේ ගරු සභාපති විසින් එවා ඇති 2010.03.12 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඉඩමේ සහ සාදනු ලබන ගොඩනැගිල්ලේ අයිතිය සභාව සතුකරගෙන අවශ්‍ය ඉදිකිරීම් සිදුකිරීමට අවසර ලබාදීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:07 **සබරගමුව උදානය - 2010**

උක්ත කරුණට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

2010 වර්ෂය තුළදී සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන එකතුවෙන් පළාත් පාලන කාර්යය භාරය හා තම බල ප්‍රදේශයට විශේෂිත වූ තොරතුරු ද ඇතුළත් ප්‍රදර්ශනයක් පැවැත්වීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව අදහස් කර ඇති අතර , පළාත් පාලන ආයතන බලප්‍රදේශ තුළ වැදගත් යැයි හඳුනාගෙන ඇති තොරතුරු ලේඛනය මත ප්‍රදර්ශන කුටියක් සකස් කරගැනීම උචිත වන බවත් ( මෙම ප්‍රදර්ශන කුටිය නැවත නැවතත් භාවිතා කළ හැකි පරිදි ගලවා සකස් කල හැකි වන අයුරින් සකස් කිරීම වඩාත් සුදුසුය. ) මේ සම්බන්ධයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ සහය ලබාගන්නා ලෙසත් දන්වා ඇත.

යෝජිත මාතෘකාවට වඩා වැදගත් යැයි හැඟෙන වෙනත් තොරතුරක් තම බලප්‍රදේශය තුළ වේනම් , එම තොරතුරු ද පදනම් කරගත හැකි අතර , මේ සඳහා සහභාගීවන්නේ නම්, ඒ බව 2010.03.25 දිනට පෙර දන්වන ලෙස එමගින් විශේෂ අවධානයට ලක්කර තිබුණි.

මෙම සභාව වෙනුවෙන් නම්කර ඇති " කසළ කළමනාකරණය හා නාගරික අලංකරණය " යන තේමාව මුල්කරගනිමින් අදාල ප්‍රදර්ශනයට සහභාගීවීමට සභාව තීරණය කරන ලදී.

05:08 **2010 වසරට සැපයුම් හා සේවා මිළදී ගැනීම:**

ඉහත සඳහන් කරුණට අදාළව මෙම සභාව විසින් දිස්ත්‍රික් ලේකම් , රත්නපුර වෙත යවන ලද 2010.03.01 දිනැති ලිපිය අදාලව එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

දිස්ත්‍රික් මිළ කමිටු වාර්තාව සකස් කරනු ලබන්නේ එම ක්ෂේත්‍රයන් පිළිබඳ නිපුනතාවයක් ඇති ආයතන ප්‍රධානීන් , ඉංජිනේරුවරුන් හා කාර්මික නිලධාරීන්ගෙන් සමන්විත වූ කමිටුවක් මගිනි. මෙම කමිටුවේ දී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලබාගන්නා මිළ ගණන් වාර්තා දීර්ඝ ලෙස විශ්ලේෂනය කර අදාල වාර්තාව සකස් කරනු ලබන අතර , ඒ අනුව දිස්ත්‍රික් මිල කමිටු වාර්තාව හෝ එහි කොටසක් ආයතන අනුව වෙනස්කල නොහැකි බව එම ලිපියෙන් දන්වා තිබුණි.

ඒ අනුව ජාතික සවිය ගම නැගුම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ දී සෑම ආයතනයක්ම දිස්ත්‍රික් මිළ කමිටු වාර්තාව පදනම්කරගත යුතු අතර , ගම නැගුම ව්‍යාපෘති සඳහා ද 2010 වර්ෂයට අදාළව සකස් කරන ලද දිස්ත්‍රික් මිළ කමිටුවේ සඳහන් මිළ ගණන් පදනම් කරගත යුතු බවත් , දිස්ත්‍රික් මිළ කමිටු වාර්තාවේ සඳහන් මිළ ගණන් අනුව ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අපහසු වන්නේ නම්, එම ව්‍යාපෘතීන්හි ක්‍රියාත්මක ආයතනය ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නම් කල හැකි බව මෙමගින් වැඩිදුරටත් අවධාරණය කර තිබුණි.

අදාල වාර්තාවේ සඳහන් මිළ ගණන් පදනම් කරගෙන ඉදිරි කටයුතු කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:09 **<u>වරිපනම් අංශයට ප්‍රින්ටරයක් ලබාගැනීම:</u>**

වරිපනම් පරිගණක ගතකිරීමේ කටයුතු අවසන් වෙමින් පවතින බැවින් , ඉදිරියේ දී බිල්පත් නිකුත් කිරීම , k පෝරම මුද්‍රණය කිරීම ආදී කටයුතු සඳහා වරිපනම් අංශයට ප්‍රින්ටරයක් ලබාදෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මිළ ගණන් කැඳවා මිළදී ගැනීමට සභාව තීරණය කරන ලදී.

05:10 **<u>සහනදායී මිළට පොත් ලබාදීම:</u>**

බළන්ගොඩ මහජන පුස්තකාලයෙන් වන සේවය අගය කරමින් , පාඨකයින්ගේ ප්‍රයෝජනය උදෙසා විශේෂ වට්ටම් සහිතව සහනදායී මිළට මහමෙව්නා සදහම් ප්‍රකාශන පුස්තකාලයට ලබාදීමට හැකි බව දන්වමින් , බළන්ගොඩ මහමෙව්නා භාවනා අසපුවේ වැලිමඩ සද්ධාසීලහිමි විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී

එම ප්‍රකාශනයන් මිළදී ගැනීමට සභාව තීරණය කරන ලදී.

05:10 **<u>නේවාසිකාගාර වැසිකිළි පද්ධතිය පිරිසිදු කිරීම:</u>**

උක්ත කරුණට අදාළව ර/ යසෝදරා අඳ බිහිරි විද්‍යාලයේ කළමනාකරු විසින් එවා ඇති 2010.03.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ර/ යසෝදරා අඳ බිහිරි විද්‍යාලය ආරම්භ වී වසර 50 ක් සපිරීම නිමිත්තෙන් 2010.03.30 දින රාත්‍රී පරිත්‍රාණ ධර්ම දේශනාවක් පවත්වා පසුදින සංඝගත දක්ෂිණාවක් පිරිනැමීමට කටයුතු යොදා තිබෙන බැවින් , නේවාසිකාගාර වැසිකිලි පද්ධතිය පිරිසිදු කරගැනීම සඳහා බළන්ගොඩ නගර සභාව සතු ගලි බවුසර නොමිලයේ ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

නොමිලයේ මෙම සේවාව ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:11 **<u>අගරු චෙක්පතක් ලබාදීම:</u>**

විනෝද බදු සඳහා අගරු චෙක්පතක් ලබාදීම වෙනුවෙන් , බළන්ගොඩ දිසා අධිකරණයෙහි අංක 1140 යටතේ සුමේද සිල්වා යන අයට එරෙහිව නඩුවක් පවරා තිබූ අතර නඩුවේ තීන්දුව ප්‍රකාරව ඔහුගෙන් මෙම සභාවට අයවිය යුතු රු.26235/- ක මුදල අයකරදෙන ලදී. අදාල නඩුවට පෙනී සිටීම වෙනුවෙන් නීතිඥ ගාස්තු වශයෙන් ඉල්ලා ඇති මුදල් ගෙවීම සඳහා සභාවේ අනුමැතිය මෙමගින් ඉල්ලා තිබිණ. නීතිඥ ගාස්තු අඩුකිරීම සම්බන්ධව සලකා බලන ලෙස ඉල්ලීමක් කිරීමටත් , ඒ අනුව අදාළ ගාස්තු ගෙවීමටත් සභාව තීරණය කරන ලදී.

05:12 **<u>උපකරණ අළුත්වැඩියා කරගැනීම:</u>**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ , බෝම්මුව , වතුකාරගොඩ , වඩුකාර්මික සී.එච්.ඩී.ලයනල් යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරනලදී.

බළන්ගොඩ නගර සභාවට අයත් තානායමෙහි අවුරුද්දක පමණ සිට තමාට අයත් වඩු උපකරණ වලින් වඩු වැඩ කටයුතු කළ අතර , ඒ සඳහා කුළිය වශයෙන් රු.15000/- ක මුදලක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මිළ ගණන් කැඳවා මෙම කාර්යය ඉටුකර ඇති බැවින් , අදාල ගෙවීම් සිදුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:13 **පුස්තකාල පොත් මිළදී ගැනීම:**

සදීපා ප්‍රකාශන මන්දිරය ගුණාත්මක බවින් යුතු ප්‍රකාශන පාඨකයන්ගේ පහසුව සඳහා විශේෂ වට්ටම් සහිතව ලබාදීමට අවස්ථාව සලසා ඇති බව දන්වමින් සදීපා ප්‍රකාශන මන්දිරයේ අලෙවි ප්‍රවර්ධන කළමනාකරු විසින් එවා ඇති 2010.02.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පුස්තකාලයට අවශ්‍ය පොත් ලැයිස්තුව සකස් කර මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:14 **ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාව ලබාදීම:**

ර/බළන්ගොඩ ජෙයිලානී ජාතික පාසලේ සම්පත් කේන්ද්‍රය ඉදිකිරීම සඳහා මෙම සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාව ලබාදීම සම්බන්ධව විද්‍යාලීය ස්තූතිය පළකරන කරනු ලබන අතර යථෝක්ත සේවාව වෙනුවෙන් මුදල් අයකිරීමක් සිදුනොකරන ලෙස ඉල්ලමින් විදුහල්පති විසින් එවා ඇති ලිපියක් සභාවට ඉදිරිපත් කරන ලදී.

සම්පත් කේන්ද්‍රයට යන මාර්ගය සකස් කිරීම මෙම සභාව විසින් කලයුතු වූ කාර්යයක් බැවින් , මේ සඳහා මුදල් අයකිරීමක් සිදුනොකිරීමට සභාව තීරණය කරන ලදී.

05:15 **රථවාහන නැවතුම් ගාස්තු අයකිරීම:**

උක්ත කරුණට අදාළව, බළන්ගොඩ , රත්නපුර පාර , රස නිවස යන ලිපිනයේ පදිංචි දීපිකා ප්‍රියදර්ශනී යන අය විසින් එවා ඇති 2010.03.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පාර්ලිමේන්තු මහ මැතිවරණය / සිංහල හා හින්දු අලුත් අවුරුදු නිවාඩුව/වෙසක් පොහොය යන කාලයන්හි නගරයට ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් නොපැමිණෙන බැවින් , ගාස්තු අයකරගැනීමේ අපහසුතාවක් තිබෙන නිසා , ඒ සම්බන්ධව සලකා බලා දින 10 ක කාලයක් මුදල් අයකිරීමෙන් නිදහස් කරන ලෙස ඉල්ලා තිබිණ.

මෙම කරුණු සැලකිල්ලටගත් සභාව , දින 08 ක කාලයකට පමණක් මුදල් අයකිරීමෙන් නිදහස් කිරීමට තීරණය කරන ලදී.

05:16 **බළන්ගොඩ තානායමේ වැහිපීල්ල සකස් කිරීම:**

බළන්ගොඩ තානායමේ වැහිපීල්ල සකස් කිරීම සඳහා මිළ ගණන් කැඳවා එම්.ජී.පී.එස්.පෙරේරා මහතාගේ මිළ ගණන් පිළිගෙන ඇත. අදාල කාර්යය ඉටුකිරීම සඳහා ඔහු විසින් රු.75000/- ක අත්තිකාරමක් ඉල්ලා ඇති බවත් , නමුත් ගෙවීමට හැකිවනුයේ අත්තිකාරම් 20% ක් වන බැවින් , එම මුදල ප්‍රමාණවත් නොවන බැවින් , කාර්යය කිරීමට නොහැකි බව දැණුම්දී ඇති බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

අත්තිකාරම් වශයෙන් ඉල්ලා ඇති මුදල ගෙවිය නොහැකි බැවින් , වෙනත් අයෙකු ලවා අදාල කාර්යය ඉටුකරගැනීමට සභාව තීරණය කරන ලදී.

05:17 **මාර්ගය පිළිසකර කිරීම:**

බළන්ගොඩ , ශෛලතලාරාම මාවත , මෙගොඩ කිරිඳිගල , කලුවැල්ල මූකලාන ගම්මානයේ මාර්ගය ඉතා අබලන්ව පවතින බැවින් , මේ පිළිබඳව සලකා බලා මාර්ගය පිළිසකර කරදෙන ලෙස ඉල්ලා ප්‍රදේශවාසීන්ගේ අත්සන් සහිතව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව පරීක්ෂා කරබලා , අවශ්‍යතාවය අනුව තීරණයක් ගැනීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

05:18 **ජල ණය**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ මහජන බැංකුවේ කළමනාකරු විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම නගර සභාව නමින් ඇති අංකඃ 6001-000032116 , 6001-000031304 සහ 6001-000030671 දරණ ස්ථිර තැන්පත් ගිණුම්වල ශේෂය මත ලබා දී ඇති ජල ණය මුදල් වලින් කොටසක් මේ වනතෙක් හිඟව පවතින බැවින් , ණය ශේෂය පියවීමට කඩිනමින් කටයුතු කරන ලෙසත් , එසේ නොකරන්නේ නම්, ඇප වශයෙන් තබා ඇති ස්ථිර තැන්පත් ගිණුම වසා ණය මුදල් හා පොළිය අයකරගැනීමට සිදුවන බව එමගින් දන්වා තිබිණ.

අදාල හිඟ මුදල වහාම ගෙවන ලෙස පාරිභෝගිකයින් වෙත දැණුම්දීමටත් ඔවුන් , එසේ නොකරන්නේ නම් ජලය විසන්ධි කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙස ජල සම්පාදන මණ්ඩලය වෙත දැණුම්දීමටත් තීරණය කරන ලදී.

ණය මුදල් නොගෙවනු ලබන පාරිභෝගිකයින් සම්බන්ධව නීත්‍යානුකුල ක්‍රියාමාර්ග ගන්නා ලෙස බැංකුව වෙත දැණුම්දීමටත් සභාව වැඩිදුරටත් තීරණය කරන ලදී.

05:19 **සභික දීමනා ප්‍රතිපූර්ණය කිරීමඃ**

2010 මාර්තු මාසයේ සිට අදාළ මාසයේ මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණය කරගැනීමට යැවීමේ දී වැටුප් ගෙවන ලද වවුචර්පතේ ඡායා පිටපතක් යැවීමට ඇති බැවින් , දීමනාව ඒ මාසය තුළදීම ලබාගත යුතු බවත් , එසේ ලබානොගතහොත් එම මුදල ප්‍රතිපූර්ණය කරගැනීමට නොහැකිවන බව බැවින් , අදාළ මාසයට පසුව ගෙවීම් කල නොහැකි බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපිය කෙරෙහි ගරු සභාවේ අවධානය යොමු කරන ලදී.

05:20 **කසල බද්ද ඉවත් කරගැනීමඃ**

ඉහත සඳහන් කාරණයට අදාළව රන්දිළු රිසෝට් ආයතනයේ කළමනාකරු විසින් එවා ඇති 2010.03.12 දිනැති ලිපිය සභාගත කරන ලදී.

එම ඉල්ලීම සලකා බැලු සභාව , දැනට රන්දිළු රිසෝට් ආයතනය කසල වෙන්කර ලබාදෙනු ලබන බැවින් , එම ආයතනය 2010 පෙබරවාරි හා මාර්තු මාස 02 ක කසල බද්දෙන් නිදහස් කිරීමට සභාව තීරණය කරන ලදී.

05:21 **හිඟව පවතින විනෝද බදු මුදල් ලේඛනයෙන් කපාහැරීමඃ**

2006 ජනවාරි සිට මැයි දක්වා අයවිය යුතු වු විනෝද බදු මුදල රු.71595.12 ක් වන අතර , එම මුදල් මෙතෙක් ලැබී නොමැති බැවින් , මෙම හිඟ මුදල් ලේඛනයෙන් කපා හැරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව අදාල හිඟ මුදල් ලේඛනයෙන් කපාහැරීමට තීරණය කරන ලදී.

06. **මුදල් ගෙවීම් අනුමත කිරීම** ( රු.10,000/- ට වැඩි ගෙවීම් )

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක් අංකය | මුදල |
|---|---|---|---|---|
| 2010.02.16 | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය බුලත්ගම නිශාන්ත ගරාජය අසල පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 44 | 652969 | 132493.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2010.02.16 | බී.ගුණරත්න<br>210.02.01 දින සිට 2010.02.15 දින දක්වා නගරයේ කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා කම්කරුවන් යෙදවීම | 45 | 652970 | 100583.33 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2009.11.11 සිට 2009.11.22 දින දක්වා ඉන්ධන බිල පියවීම<br><br>වර්ගය ඒකක මිල වටිනාකම ප්‍රමාණය<br>ඩීසල් 73.20 254 18592.80<br>පැට්‍රල් 130.20 8 1041.60<br>19634.40 | 46 | 652971 | 19634.40 |
| 2010.02.16 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2009.11.19 සිට 2009.11.26 දක්වා ඉන්ධන බිල පියවීම<br><br>වර්ගය ඒකක මිල ප්‍රමාණය වටිනාකම<br>ඩීසල් 73.20 988.80 72380.16<br>එන්ජින් 475 01 475.00<br>ගියර් ඔයිල් 4 ලී කෑන් 662 01 ලී 4<br>පැට්‍රල් 130.20 37 4817.40<br>ටූ.ටී. 1/2 180 01 180.00<br>ඩී.එස්.කෑන් 1615 01 1615.00<br>81129.56 | 47 | 652971 | 81129.56 |
| 2010.02.18 | ජේ.ජී.පී.වික්‍රමසිංහ<br>නව කියවීම් ශාලාවට සහ මහජන පුස්තකාලයට 2010 ජනවාරි මස දිනපතා සහ සතිපතා පුවත්පත් සැපයීම වෙනුවෙන් | 49 | 652973 | 16770.00 |
| 2010.02.18 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>තානායමේ මායිම් තාප්පය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා සිමෙන්ති මිටි 100 වෙනුවෙන් ගෙවීම<br>සිමෙන්ති මිටි 01 මිල 720.00<br>( පැටවුම් කුලි සමඟ)<br>සිමෙන්ති මිටි 100 සඳහා<br>720x100<br>72000/- | 50 | 652974 | 72000.00 |
| 2010.02.18 | කැළණි ඒජන්සීස්<br>බැංකියවත්ත ජල ටැංකිය සඳහා අවශ්‍ය ජල මෝටරය මිළදී ගැනීම | 52 | 652976 | 29150.00 |
| | ඒ.එච්.සාබු<br>නගර සභා ගර්භය හා සභාපතිතුමාගේ කාමරය තිර රෙදි දැමීම | 53 | 652977 | 144418.50 |

| | | | | |
|---|---|---|---|---|
| 2010.02.18 | වැකර් ඉලෙක්ට්‍රික් කොම්පැණි<br>කාර්යාල සඳහා මේන් ස්වීච් එකක් ලබාගැනීම<br>මේන් ස්වීච් 01 11200.00<br>Vat 12% 1344.00 | 55 | 652979 | 12544.00 |
| | ජගත් එන්ටප්‍රයිසස්<br>නගර සභා පෙර පාසල පුළුල් කිරීම කර්මාන්තය හා තානායම ඇලුත්වැඩියා කිරීමේ කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය ඉදිකිරීම් උපාංග ලබාගැනීම | 56 | 652980 | 18325.00 |
| 2010.02.18 | හර්ෂණ කලර් සෙන්ටර්<br>තානායම තීන්ත ආලේපය හා විදුණැන පියස මධ්‍යස්ථානය තීන්ත ආලේප කිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 61 | 652983 | 20315.40 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2009.10.22 සිට 2009.10.27 දක්වා ඉන්ධන බිල පියවීම<br>වර්ගය ඒකක මිල ප්‍රමාණය වටිනාකම<br>ඩීසල් 73.20 239 17494.80<br>පැට්‍රල් 130.20 10 1302.00<br>18796.80 | 62 | 652984 | 18796.80 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2009.12.09 සිට 2009.12.22 දින දක්වා ඉන්ධන බිල පියවීම<br>වර්ගය ඒකක මිළ ප්‍රමාණය වටිනාකම<br>ඩීසල් 73.70 780.30 57117.96<br>එන්.ඔයිල් 323.00 01 ලී 323.00<br>පැට්‍රල් 130.20 42 5468.40<br>භූමිතෙල් 51.20 10 512.00<br>ටූ.ටී. 1/2 180.00 01 180.00<br>63601.36 | 63 | 652984 | 63601.36 |
| 2010.02.18 | මෙට්රොපොලිටන් ඔෆීස් පුද්ගලික සමාගම<br>නගර සභාවේ පරිහරණය සඳහා Image Runer 2318 L Digital Laser Copier වර්ගයේ ෆැක්ස් යන්ත්‍රයක් මිළදි ගැනීම | 67 | 625987 | 57680.00<br>164634.40 |
| | තාවකාලික වැටුප් කර්මාන්ත අංශය<br>2010 පෙබරවාරි මස 01-15<br>දින දක්වා කර්මාන්ත අංශයේ තාවාකාලික වැටුප් ගෙවීම<br>කරව්කැටිය පාර ශුද්ධ කිරීම 1500/-<br>තානායම ආරක්ෂක වැඨා<br>මායිම් තාප්පය ඉදිකිරිම 76500/-<br>විධායක ඉංජිනේරු කාර්යාලය<br>අසල 5500/-<br>තානායම අ.වැ. 42875/-<br>ළදරු පාසල් ගොඩනැගිල්ල<br>තීන්ත ආලේප කිරීම 4250/-<br>කොටුගොඩැල්ල පාර ශුද්ධ කිරීම 1500/- | 68 | 651989 | 132125.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2010.02.22 | සභාපති , තුමගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>පල්ලෙවෙල කුඹුර අද්දර මාර්ගය පැති බැම්ම බැඳීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 69 | 625990 | 252664.64 |
| 2010.02.22 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2009.12.22 සිට 2009.12.28 දක්වා ඉන්ධන බිල පියවීම<br><br>වර්ගය එකක මිල ප්‍රමාණය වටිනාකම<br>ඩීසල් 73.20 907 66392.40<br>එන්.ඔයිල් 323 01 323.00<br>එන්.ඔයිල් 446 02 892.00<br>පැට්‍රල් 130.20 24 ලී 3124.80<br>කූලන්ට් 522 01 කෑන් 522.00<br>භූමිතෙල් 51.20 40 2048.00<br>73302.20 | 70 | 625991 | 73302.20 |
| 2010.02.22 | ටී.ජ්.ටී.එච්.තෙබුවන<br>එච්.එෆ්.8952 ට්‍රැක්ටරයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් මුදල් ගෙවීම | 72 | 625992 | 16008.00 |
| 2010.02.22 | ර/ බළන්ගොඩ ශාන්ත ඇග්නස් බාළිකා විද්‍යාලීය පාසල් නගා සිටුවීමේ වැඩසටහන ප්‍රතිචක්‍රීයකරණය කල හැකි කසල මිළදි ගැනීමේ මධ්‍යස්ථාන ඉදිකිරිම 10% රැඳවුම් හා ගිවිසුම් ඇප තැන්පත් ආපසු ගෙවීම<br>10% රැඳවුම් 26558.02<br>ගිවිසුම් ඇප තැන්පත් 13279.00 | 73 | 625994 | 39837.02 |
| 2010.02.22 | රිචඩ් ප්‍රැන්සිස්<br>ඉදිකිරිම් කටයුතු සඳහා අවශ්‍ය වැලි කියුබ් 07 මිළදි ගැනීම<br>වැලි කියුබ් 01 3750.00<br>වැලි කියුබ් 07 සඳහා 3750x7 | 75 | 625995 | 26250.00 |
| 2010.02.25 | පළාත් පාලන කොමසාරිස්<br>පුස්තකාල සේවා මණ්ඩලය විවෘත කිරීම නිමිත්තෙන් පිහිටුවන ලබන 1 ශ්‍රේණිය ආශ්‍රිත පුස්තකාල සඳහා අවශ්‍ය පොත් මිළදි ගැනීම | 89 | 654182 | 50000.00 |
| 2010.02.25 | ජේ.එෆ්.ඩිස්ට්‍රිබියුටර්ස්<br>නගර සභා උඩුමහලේ ආරක්ෂක කුටිය ඉදිකිරිමේ කර්මාන්තය සඳහා අවශ්‍ය ඉදිකිරීම් උපාංග මිළදි ගැනීම | 90 | 654183 | 10629.00 |
| 2010.02.26 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සිමෙන්ති මිටි 80 මිළදි ගැනීම | 91 | 654184 | 57600.00 |
| 2010.02.26 | රිචඩ් ප්‍රැන්සිස්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වැලි කියුබ් 3 1/4 මිළදි ගැනීම සඳහා<br>වැලි කියුබ් 01 මිළ 3750.00<br>වැලි කියුබ් 3 1/2 සඳහා 3750x 3 ½ | 92 | 654185 | 13125.00 |

| | | | | |
|---|---|---|---|---|
| | ජෝති ස්ටෝර්ස්<br>කාර්යාලයේ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 94 | 654187 | 48172.00 |
| | තාවකාලික වැටුප් ගෙවීම - ආදායම් අංශය<br>2010 පෙබරවාරි 01 සිට 25 දක්වා නගර සභා බල ප්‍රදේශයේ දේපල තක්සේරු කිරීමේ දී සහායකයින් සඳහා දීමනා ගෙවීම | 95-1 | 654188 | 60000.00 |
| 2010.03.01 | 2010 මාර්තු මාසය<br>සභාපති විජනත්කුඹුර විජය ග්‍රාම සංවර්ධන සමිතිය<br>සරස්වතීවත්ත පාර සුසාන භූමිය ඉහල කොටස කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරිම කර්මාන්තය 10% රැඳවුම් ගෙවීම හා ගිවිසුම් ඇප තැන්පත් ආපසු ගෙවීම | 07 | 654194 | 68366.34 |
| 2010.03.01 | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>ඕළුගන්තොට සුසාන භූමිය ගේට්ටුව සාදා මාර්ගය කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම. | 08 | 654195 | 249921.83 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>2010 ජනවාරි මාසයේ දුරකථන බිල් පියවීම<br>දුරකථන අංකය මුදල<br>2287275 5531.16<br>2287153 2307.75<br>2286596 2413.22<br>2288737 7084.48<br>E-mail 230.92<br>17567.53 | 09 | 654196 | 17567.53 |
| | එල්.ඊ.සී.සී.මෙටල් ක්‍රෂර්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය 6x9 ගල් කියුබ් 9.44 1 1/2 ගල් කියුබ් 01 සදහා<br>වර්ගය එකක මිල ප්‍රමාණය වටිනාකම<br>6x9 ගල් 2300 9.44 21712.00<br>1 1/2 ගල් 4400 01 4400.00<br>26112.00 | 10 | 654197 | 26112.00 |
| 2010.03.01 | ජයන්ති ටයර් සෙන්ටර්<br>අංකඃ 227-5020 ගලි බවුසරයට ටයර් 02 හා ටියුබ් 01 මිළදී ගැනීම<br>වර්ගය එකක මිල ප්‍රමාණය වටිනාකම<br>700x16 ටයර් 13950.00 02 27900.00<br>700x16 ටියුබ් 1500 01 1500.00<br>29400.00 | 11 | 654198 | 29400.00 |
| | එච්.එල්.පි.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර්<br>තානායම අලුත්වැඩියාව වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය හා ඉරිදා පොළ මඩුව ඉදිකිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 13 | 654199 | 26015.00 |
| | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර්<br>නගර සභා පෙර පාසල පුළුල් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය ඉදිකිරීම් | 14 | 654199 | 42257.00 |

| | | | | |
|---|---|---|---|---|
| | උපාංග මිළදී ගැනීම වෙනුවෙන් හා වැවේවත්ත ප්‍රජා ශාලාවේ ජලනල අලුත්වැඩියාව - අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | | | |
| 2010.03.01 | හර්ෂණ කලර් සෙන්ටර්<br>පෙර පාසල නවීකරණය කිරිමේ දී අවශ්‍ය තින්ත මිළදී ගැනීම . තානායම අලුත්වැඩියාවේ දී අවශ්‍ය තින්ත මිළදී ගැනීම | 15 | 654200 | 32572.26 |
| | සභාපති , නාගරික සමෘද්ධි බලකාය , බළන්ගොඩ නගර වසම<br>බළන්ගොඩ සිටිගාඩ්නස් පාර කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ 10% රුදවුම් හා තැන්පත් ආපසු ගෙවීම | 16 | 654001 | 73771.38 |
| 2010.03.03 | කළමණාකරු , ජල සම්පාදන මණ්ඩලය<br>2010 පෙබරවාරි මාසයේ ජල බිල පියවීම<br>පොදු වෙළඳසැල 14968.80<br>පිංතාලිය 1467.20 | 17 | 654002 | 16436.00 |
| | සාමාන්‍යාධිකාරි ලංකා විදුලිබල මණ්ඩලය<br>2010 පෙබරවාරි මාසයේ විදුලිබිල පියවීම<br>කාර්යාලය 12661.50<br>නගර සභාවට යාබද 981.00<br>13642.50 | 19 | 654004 | 13642.50 |
| 2010.03.03 | සාමාන්‍යාධිකාරි , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2010.01.12 සිට 2010.01.25 දින දක්වා ඉන්ධන බිල පියවීම<br>වර්ගය එකක මිල ප්‍රමාණය මුදල<br>ඩීසල් 73.20 818 59877.60<br>එන්.ඔයිල් 323 01 323.00<br>පැට්‍රල් 115.20 68 7833.60<br>ටූ.ටී. 1/2 180 01 ලි 180.00 | 23 | 654006 | 68214.20 |
| | සාමාන්‍යාධිකාරි , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2010.01.11 සිට 2010.01.18 දක්වා ඉන්ධන බිල පියවීම<br>වර්ගය එකක මිල ප්‍රමාණය මුදල<br>ඩීසල් 73.20 871 63757.20<br>එන්. ඔයිල් 323 01 323.00<br>එන්.ඔයිල් 333 10 ලී 3330.00<br>පැට්‍රල් 115.20 16 1843.00<br>භූමිතෙල් 51.20 05 ලී 256.00<br>69509.40 | 24 | 654006 | 69509.40 |
| 2010.03.03 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2010.01.01 සිට 2010.01.08 දින දික්වා ඉන්ධන බිල පියවීම<br>වර්ගය එකක මිල ප්‍රමාණය<br>ඩීසල් 73.20 1147 83960.40<br>එන්ජින් ඔයිල් 323.00 01 323.00<br>පැට්‍රල් 115.20 35.5 4089.60<br>ටූ.ටී.1/2 180.00 01 180.00<br>භූමිතෙල් 51.20 42 2150.40 | 25 | 65406 | 96308.40 |

| | | | | |
|---|---|---|---|---|
| | හයිඩ්‍රොලික් 5605.00 01 5605.00<br>96308.40 | | | |
| | සාමාන්‍යාධිකාරි , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2009.12.09 සිට 2009.12.30 දක්වා ඉන්ධන බිල පියවීම<br>වර්ගය එකක මිල ප්‍රමාණය වටිනාකම<br>ඩීසල් 73.20 494.40 36160.80<br>පැට්‍රල් 130.20 15 1953.00<br>පැට්‍රල් 115.20 18 2073.60<br>භූමිතෙල් 51.20 05 256.00<br>40443.40 | | | 40443.40 |
| 2010.03.03 | කළමණාකරු, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රක්ෂණ කාල සීමාව අවසන් වාහන 09 ක් රක්ෂණය කිරීමට මුදල් ගෙවීම.<br>වාහන අංකය වර්ගය මුදල<br>UQ-1933 යතුරු පැදිය 4582.34<br>G.K.6227 ට්‍රැක්ටරය 9635.39<br>G.K.1483 ට්‍රැක්ටරය 9635.39<br>37-7933 ට්‍රැක්ටරය 5543.57<br>47-1565 ට්‍රේලරය 1442.22<br>46-4907 ට්‍රේලරය 1545.19<br>46-3164 ට්‍රේලරය 1627.44<br>44-7142 ට්‍රේලරය 1421.84<br>67-3301 ජල බවුසරය 1904.92 | 27 | 654007 | 37338.30 |
| | කළමනාකරු, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නගර සභාවට ත්‍යාගයක් ලෙස ලැබුණ RB 4786 ට්‍රැක්ටරය හා එහි ට්‍රේලරය රක්ෂණය කිරීමට මුදල් ගෙවීම | 28 | 654007 | 12185.08 |
| | තාවකාලික වැටුප් ගෙවීම - කර්මාන්ත අංශය 2010.02.06 සිට 2010.02.28 දින දක්වා තාවකාලික කම්කරු වැටුප් ගෙවීම | 29-1 | 654008 | 118375.00 |
| 2010.03.04 | සාමාන්‍යාධිකාරි , ලංකා විදුලිබල මණ්ඩල 2010 පෙබරවාරි මස විදුලිබිල පියවීම<br>පොදු වෙළඳසැල 12252.00<br>ප්‍රේක්ෂකාගාරය 435.00 | 34 | 654016 | 12687.00 |
| 2010.03.04 | ටී.ඒ.ටී.එච්.තෙබුවන<br>එච්.එෆ්.8558 ට්‍රැක්ටරයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් මුදල් ගෙවීම | 35 | 654014 | 23727.00 |
| | ටී.ඒ.ටී.එච්.තෙබුවන<br>අංකඃ 226-7521 ටිපර් රථයේ දුනුබුෂ් හා යසිලන්සර් බුෂ් අලුත්වැඩියා කිරීම | 36 | 654014 | 22940.00 |
| 2010.03.04 | බී.ගුණරත්න<br>2010.02.16 දින සිට 2010.02.28 දක්වා නගරයේ | 37 | 654015 | 100583.33 |

| | | | | |
|---|---|---|---|---|
| | කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහනය සඳහා කම්කරුවන් යෙදවීම. | | | |
| 2010.03.08 | ජයන්ති ටයර් සෙන්ටර්<br>අංක 56-1906 කෘෂ කැබ් රථයට ජී.ටී.700x15 ටයර් 04 මිළදි ගැනිම<br>ඒකක මිල 12450.00<br>700x15 ටයර් 4 12450x4 | 39 | 654018 | 49800.00 |
| | කේ.ජී.ගෙන්ගා දරම්<br>කොම්පෝස්ට් පොහොර ඇසුරුම් කිරීම සඳහා හිස් ඉටි උර 1000 මිළදි ගැනීම<br>ඉටි උර 01 මිළ - 18<br>ඉටි උර 1000 සඳහා 18x1000 | 40 | 654019 | 18000.00 |
| 2010.03.10 | ජී.ඩබ්.ඉන්ද්‍රලාල්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වැලි කියුබ් 09 ලබාගැනීම<br>වැලි කියුබ් 01 මිළ 4000.00<br>වැලි කියුබ් 09 සඳහා 4000x9 | 41 | 654020 | 36000.00 |
| | ජෝති ස්ටෝර්ස්<br>කාර්යාලයේ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 43 | 654022 | 28998.00 |
| | සභාපති , බලගහමුල සමෘද්ධි සමිතිය<br>උඩ ඇල්ලෙපොල ජේන්නෝනා මියගේ නිවාස වලට යන පාලම් දෙක ඉදිකිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම. | 48 | 654022 | 234726.00 |
| 2010.03.10 | ඉන්දික එරික් සිසිල්<br>පල්ලේකැලේ දැයට කිරුළ ප්‍රදර්ශනය වෙත නගර සභාවේ ප්‍රදර්ශන භාණ්ඩ 2010.02.01 දින ප්‍රවාහනය කිරිමත් 2010.02.10 දින නැවත එම ප්‍රදර්ශන භාණ්ඩ බලන්ගොඩ දක්වා ප්‍රවාහනය කිරීමත් වෙනුවෙන් මුදල් ගෙවීම | 50 | 654029 | 32000.00 |
| | ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්<br>බළන්ගොඩ තානායමේ ජනෙල් ග්‍රිල් ගැසිම වෙනුවෙන් ගෙවීම | 51 | 654030 | 129532.00 |
| | ටී.එම්.අයි.සමන්සිරි<br>බළන්ගොඩ නව බස්නැවතුම්පල සහිත වෙළඳ සංකීර්ණයේ පළඳු වී ඇති විදුලි පද්ධතිය නැවත සකස් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම<br>ගෙවීමට ඇති මුළු මුදල 376774.00<br>ගෙවු මුදල ( අඩුකලා) 225000.00 | 52 | 654031 | 151774.00 |
| 2010.03.11 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2010.01.04 සිට 2010.01.31 දක්වා ඉන්ධන බිල පියවීම<br><br>වර්ගය / ඒකක මිල / ප්‍රමාණය / වටිනාකම<br>ඩීසල් 73.20 398 29133.60<br>පැට්‍රල් 115.20 16 1843.20<br>30976.80 | 53 | 654032 | 30976.80 |
| | හර්ෂන කලර් සෙන්ටර්<br>කාර්යාලයේ ආරක්ෂක කුටිය ඉදිකිරීම කර්මාන්තයට අවශ්‍ය තීන්ත මිළදි ගැනීම | 54 | 654033 | 14222.74 |
| | හර්ෂන කලර් සෙන්ටර්<br>බළන්ගොඩ නගර සභා පෙර පාසල තීන්ත ආලේප කිරීම වෙනුවෙන් ද්‍රව්‍ය ලබාගැනීම | 55 | 654033 | 25002.76 |

ඉහත සඳහන් මුදල් ගෙවීම් සියල්ල අනුමත කිරීමට සභාව තීරණය කරන ලදී.

07 **ඇස්තමේන්තු අනුමත කිරීම:**

පහත සඳහන් ඇස්තමේන්තු සභා අනුමැතියට ඉදිරිපත් කරතිබුණි.

01. තලංගම විද්‍යාලය අසල හියුම් පයිප්ප බෝක්කුව යෙදීම රු. 34355.51

02. ඇල්ලෙපොල සරස්වතීවත්ත පාර අංක 30 නිවස අසල පඩිපෙළ ඉදිකිරීම රු. 94171.30

03. බැංකියවත්ත ප්‍රධාන ගේට්ටුව අසල ගොඩනැගිල්ල නවීකරණය කිරීම රු. 276283.68

04. මැද කිරිදිගල මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීමට හැකිවන අයුරින් කොන්ක්‍රීට් කාණු බෝක්කු ඉදිකිරීම රු. 513090.70

05. මැද කිරිදිගල මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීමට හැකිවන අයුරින් බැම් බැඳ බෝක්කු දමා සංවර්ධනය කිරීම රු. 531716.44

06. බළන්ගොඩ තානායම අළුත්වැඩියා කිරීම අමතර වැඩකොටස් සඳහා වියදම් ඇස්තමේන්තුව රු. 3679353.31

07. සුදර්ශනගම කොටසක් සඳහා ජලය ලබාදීම සඳහා වන වියදම් ඇස්තමේන්තුව රු. 504312.72

ඉහත සඳහන් ඇස්තමේන්තු සියල්ල සභාව විසින් අනුමත කල අතර , අංක: 07 යටතේ සඳහන් කර්මාන්තය මහා මැතිවරණයට පෙර නිමකිරීමට තීරණය කරන ලදී.

**08.1 යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ :**

නැත

**යථා පරිදි කල් දී ඇති යෝජනා :**

නැත.

**09. ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම**

09:01 **තානායමේ මායිම් තාප්පය දැල් ගැසීම:**

තානායමේ මායිම් තාප්පය දැල් ගැසීමේ කර්මාන්තය සඳහා අවශ්‍ය කරන භාණ්ඩ මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලදී. අදාල මිළ ගණන් පහත දැක්වේ.

| | ඩබ්.ජේ.එන්.සී. හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස් | ජගත් එන්ටර්ප්‍රයිසස් | යශෝධා හාඩ්වෙයාර් | දේශානී හාඩ්වෙයාර් |
|---|---|---|---|---|
| නො.8 දැල් රෝල් (6' ) | 28113/- | 32100/- | 32906.25 | 29518.65 |
| 2 හෙවි ජී.අයි.බට | 3600/- | 3750/- | 3300/- | 3550/- |
| 1"හෙවි ජී.අයි.බට | 1675/- | 1750/- | 1600/- | 1750/- |

| | | | | |
|---|---|---|---|---|
| ජේ හුක්ස් | 210/- | 215/- | 250/- | 220/- |
| කොළ පාට වයර් | 385/- | 425/- | 55 /- | 450/- |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ඉදිරිපත් ඇති ආයතන වලින් අවශ්‍ය භාණ්ඩ මිළදී ගැනීමට සභාව තීරණය කරන ලදී.

09:02 **කුකුලන් ඇතිකිරිම සඳහා කුඩුව සකස් කිරීම:**

බැංකියවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කුකුලන් ඇතිකිරීමට කුඩුව සකස් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය භාණ්ඩ මිළදී ගැනීමට කැඳවන ලද මිළ ගණන් පහත දැක්වේ.

| | ජගත් එන්ටර්ප්‍රයිසස් | ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස් | යශෝධා හාඩ්වෙයාර් | දේශානී හාඩ්වෙයාර් |
|---|---|---|---|---|
| 2 " හෙවි ජී.අයි.බට | 3750/- | 3600/- | 3300/- | 3550/- |
| 1" හෙවි ජී.අයි.බට | 1750/- | 1675/- | 1600/- | 1715/- |
| 1 1/4 L Iron | 1650/- | 1600/- | 1400/- | 1650/- |
| අමානෝ 6 " සීට් | 1400/- | 1320/- | 1200/- | 1425/- |
| කුකුල් දැල් | 8200/- | 6650/- | 8000/- | - |
| 1"x1" බොක්ස් බාර් | 850/- | 800/- | 575/- | 820/- |
| 1" පට්ටම් | 835/- | 825/- | 1 400/- ii 550/- | 830/- |
| 2"x4" සරනේරු | 130/- | 130/- | 90/- | 120/- |
| අමානෝ ඇණ | 24/- | 15/- | 20/- | 22/- |
| 10 මි.මි.දගර වානේ | 390/- | 330/- | i. 185/- ii. 380/- iii. 355/- iv. 425/- | 395/- |
| අමානෝ රීජ් කැප් | 180/- | 150/- | - | 190/- |

අවම මිළ ඉදිරිපත්කර ඇති ආයතන වලින් මිළදී ගැනීමට තීරණය කරන ලදී.

09:03 **ජී.කේ.6227 ට්‍රැක්ටරයට බැටරියක් මිළදී ගැනීම:**

ඉහත අංක දරණ ට්‍රැක්ටරයකට ඇම්පියර් 90 බැටරියක් මිළදී ගැනීමට ලබාගත් මිළ ගණන් පහත දැක්වේ.

| වර්ගය | ජයන්ති ටයර් සෙන්ටර් | නිෂානි මෝටර්ස් | බළන්ගොඩ ටයර් සර්විස් |
|---|---|---|---|
| ඇම්පියර් 90 incoe බැටරි 01 ක් | 13600/- | 13800/- | 13900/- |

ඉහත මිළ ගණන් අතුරින් ජයන්ති ටයර් සෙන්ටර් ආයතනයේ අවම මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:04 **බොබ්කැට් යන්ත්‍රය සේවා කිරීම:**

මෙම නගර සභාව සතු බොබ් කැට් යන්ත්‍රයේ මීටර් පැය 2000 පූර්ණ සේවාව සිදුගැනීම වෙනුවෙන් රු.116537.73 ක් ගෙවිය යුතුවේ. එම මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:05 **තානායම අළුත්වැඩියාව:**

බළන්ගොඩ තානායම ඉදිකිරීම සඳහා අවශ්‍ය කරන පහත සඳහන් භාණ්ඩ මිළදී ගැනීම වෙනුවෙන් මිළ ගණන් කැඳවන ලදී. අදාල මිළ ගණන් පහත දැක්වේ.

| | **සෙවන ග්ලාස් හවුස්** | ගැමුණු හාඩ්වෙයාර් | සරණී පික්චර් පැලස් | සේනානී හාඩ්වෙයාර් | සෙන්ට්‍රල් ට්‍රේඩින් කම්පැණි |
|---|---|---|---|---|---|
| මාස්ටර් ලොක් 01 | **4850/-** | 4870/- | 4885/- | 4895/- | 4868/- |
| ලක්ෂ්මි දොර ලොක් 01 | **3250/-** | 3265/- | 3280/- | 3292/- | 3256/- |
| පැල්ට් දොර ලොක් 01 | **13500/-** | 13640/- | 13775/- | 13590/- | 13550/- |
| පැල්ට් ලොක් 01 | **3050/-** | 3075/- | 3075/- | 3090/- | 3060/- |
| බර්ඩ් ලොක් 01 | **875/-** | 885/- | 890/- | 885/- | 875/- |
| 8x1/2 පිත්තල සොයිබ 01 | **480/-** | 495/- | - | 490/- | 485/- |
| 4x ½ පිත්තල සොයිබ 01 | **225/-** | 240/- | - | 250/- | 235/- |
| දොර ලොක් 01 | **3250/-** | 3265/- | 3280/- | 3292/- | 3256/- |
| 8/5x5 පිත්තල ස්.ඇණ | **2.80** | 2.85 | 2.85 | 3/- | 2.85 |
| පිත්තල දොර හැඩල් | **195/-** | 195/- | - | 210/- | - |
| යුනියන් ලොක් | **2300/-** | 2350/- | 2345/- | 2360/- | 2350/- |

අවම මිළ ඉදිරිපත් කරඇති සෙවන ග්ලාස් හවුස් ආයතනය වෙතින් අවශ්‍ය උපකරණ මිළදී ගැනීමට තීරණය කරන ලදී.

09:06 **නිළ ඇඳුම් රෙදි ලබාගැනීම:**

කාර්යාලයේ නිල ඇඳුම් හිමි නිලධාරීන්ට හා සේවකයන්ට නිල ඇඳුම් සැපයීම සඳහා රෙදි මිළට ගැනීම වෙනුවෙන් කැඳවු මිළ ගණන් පහත දැක්වේ.

| | හීරෝ ටෙක්ස් | ලිතුමිතාස් | ටාටා ටෙක්ස් | අරුණ ට්‍රේඩර්ස් | සළුසල | චීප් සයිඩ් |
|---|---|---|---|---|---|---|
| කාකි රෙදි මීටර 01 | 170/-<br>200/-<br>210/-<br>220/-<br>250/- | 310/-<br>200/-<br>320/- | 252/-<br>302.40<br>319.20<br>403.20<br>476/- | 450/-<br>425/-<br>400/-<br>390/-<br>200/-<br>375/-<br>350/-<br>300/- | 245/-<br>372/-<br>395/- | 265/- |
| සුදු කලිසම් රෙදි මීටර් 01 | 170/-<br>200/-<br>225/-<br>240/- | 200/-<br>310/-<br>300/- | 252/-<br>302.40<br>369.60<br>403.20 | 200/-<br>300/-<br>400/-<br>390/- | 245/-<br>410/- | 290/- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 280/-<br>300/-<br>330/- | | 476/- | 425/-<br>450/- | | |
| සුදු කමිස රෙදි මීටර් 01 | 250/-<br>230/-<br>220/-<br>200/-<br>190/-<br>180/-<br>140/-<br>120/-<br>90/- | 190/-<br>275/- | 184.80<br>225/-<br>282.24<br>302.40<br>308/-<br>336/- | 195/-<br>225/-<br>235/-<br>325/-<br>330/-<br>350/- | 112/-<br>**125/-**<br>192/-<br>205/- | 180/-<br>265/-<br>130/- |
| කළු කලිසම් රෙදි මීටර් 01 | 200/-<br>**270/-**<br>340/-<br>280/-<br>300/-<br>380/- | 310/-<br>300/-<br>290/-<br>220/- | 252/-<br>302.40<br>369.60<br>476/-<br>504/-<br>675.36<br>728/- | 350/-<br>400/-<br>450/-<br>500/-<br>550/-<br>600/-<br>650/- | 245/-<br>372/-<br>395/-<br>565/- | 190/-<br>265/-<br>440/- |

ඉහත මිළ ගණන් සලකා බැලූ සභාව , හීරෝ ටෙක්ස් ආයතනයෙන් කාකී රෙදි මීටර් 01 රු.210/- මිළට ද , සුදු කලිසම් රෙදි මීටර් 01 රු.200/- කළු කලිසම් රෙදි මීටර් 01 270/- මිළටද මිළදී ගැනීමට තීරණය කරන ලදී, සළුසල ආයතනයෙන් සුදු කමිස රෙදි මීටර් 01 රු.125/- මිළට මිළදී ගැනීමට තීරණය කරන ලදී.

**10. යෝජනා :**

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මාර්ගයන් පහත දැක්වෙන නම් වලින් නම් කිරීමට යෝජනා කරන ලදී.

**10:01 ගරු සභාපති , ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා :**

01. බළන්ගොඩ ඔරලෝසු කණුව අසල සිට දොරවෙල නව අතුරු මාර්ගය හපුතලේ පාරට වැටෙන හන්දිය දක්වා වූ කොටස " **මොහාන් සාලිය එල්ලාවල මාවත** " නමින් නම් කිරීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී , ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

02. **1952 අංක : 6 දරණ පළාත් පාලන මණ්ඩල පනතේ සම්මත අතුරු ව්‍යවස්ථාව වැළැඳගැනීම:**

1952 අංක : 6 දරණ පළාත් පාලන මණ්ඩල ආදර්ශ උපනීති පනතේ 2 වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යතුමන් විසින් සම්පාදනය කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාමාලාවේ අංක 1 සිට xxix දක්වා වූ ආදර්ශ අතුරු ව්‍යවස්ථා සියල්ල ඒ අයුරින්ම පිළිගැනීමටත් , වැළඳගැනීමටත් , ක්‍රියාකිරීමටත් ගරු සභාපති , ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10:02 ගරු නාගරික මන්ත්‍රී , ධර්මසේන සමරසිංහ මැතිතුමා:**

01. බළන්ගොඩ මහජන බැංකුව අසලින් ඇති දෙවට පාර " **ඩේවිඩ් ධර්මප්‍රිය මාවත**" නමින් නම්කිරීමට ගරු නාගරික මන්ත්‍රී , ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

10:03 **ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී.එම්.රුමි මැතිතුමා :**

01. මුගුණමලේ ගමට යන පාර " **රණවිරු වීරසිංහ මාවත** " නමින් නම් කිරීමට ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

02. කොළණිය උඩකොටසට යන පාර " **හිල් ස්ට්‍රීට්** " නමින් නම් කිරීමට ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

10:03 **ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා:**

බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තුඹගොඩ ග්‍රාම නිලධාරී වසමේ හුණුකුඹුර කෝපිවත්ත පානීය ජල ළිඳ වර්ෂ 1980 සිට කෝපිවත්ත හුණුකුඹුර ගම්වාසීන් විසින් පාවිච්චි කල ළිඳක් බවත් , දැනට කාලයක සිට එය පාවිච්චියෙන් තොවරව ඇති නිසා , එම ළිඳ සභාව මගින් අළුත්වැඩියා කර ප්‍රදේශවාසීන්ට ජලය ලබාගැනීමට අවශ්‍ය කටයුතු ඉටුකරදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

මෙය පොදු ළිඳක් බැවින් , ජනතා අයිතියට පැවරීම සඳහා ඉඩමේ අයිතිය බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් මගින් නිරවුල් කරගැනීමට සභාව තීරණය කරන ලදී.

10:05 **ගරු නාගරික මන්ත්‍රී , ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා :**

2010 වර්ෂයේ සභා අරමුදලින් මුගුණමලේ සුසාන භූමිය පාර සංවර්ධනය කිරීමට යෝජනා කර එහි වැඩ කටයුතු ඉටුකිරීමට කටයුතු කල අතර , ඉඩම් ආරවුලක් හේතුවෙන් අදාල කාර්යය ඉටුකිරීම අපහසු වී ඇති බැවින් , ඒ සඳහා යෙදවීමට නියමිත මුදල් මුදල් බළන්ගොඩ කිරිඳිගල රබර්වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කර තිබුණි.

අදාල යෝජනාව අනුව කටයුතු කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**11. කාරක සභා වල වාර්තා සලකා බැලීම:**

මෙම නගර සභාවේ 2010.03.10 වන දින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේ වාර්තාව , සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු රැස්වීමේ වාර්තාව හා 2010.03.17 දිනැති මුදල් කමිටුවේ වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාවන් අධ්‍යයනය කල සභාව එම වාර්තාවන් අනුමතකරන ලදී.

12. **ආදායම් - වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම:**

2010 වර්ෂයේ පෙබරවාරි මාසයට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 3,267,224.30 |
| වෙනත් ලැබීම් | 1,341,921.99 |
| | ----------- |
| මුළු ලැබීම් | 4,609,146.29 |
| | |
| පුනරාවර්ථන වියදම් | 3,440,550.62 |
| වෙනත් වියදම් | 3,356,937.94 |
| | ------------- |
| මුළු වියදම් | 6,797,488.56 |
| | ========= |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

12:02 2010.01.01 දින සිට 2010.01.30 දින දක්වා මෙම නගර සභාව සතු වාහන සඳහා වැය වූ ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව , එම වාර්තාව සභාව විසින් අනුමත ලදී.

13. **වෙනත් කරුණු :**

**13:01 ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී.එම්.රූමි මැතිතුමාඃ**

මෙම නගර සභාව විසින් පසුගියදා නිකුත් කල " අරුණළු " සඟරාව ඉතා වැදගත් වන අතර , එවැනි සඟරාවක් නිකුත් කිරීමට ක්‍රියාකිරීම අගය කලයුතු කාර්යයක් වන බව දැන්වීය. මෙමගින් ප්‍රදේශයේ ජනතාවට මෙම සභාව විසින් , ගරු මන්ත්‍රීවරුන් විසින් ඉටුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් සම්බන්ධව දැනුවත්වීමක් සිදුවන බව පැවසීය. මෙම සඟරාවට ඇතුළත් කරනු ලබන ඡායා රූප වර්ණ ඡායා රූප වලින් නිකුත් කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලීමක් කරන ලදී. එසේම නගරයේ පාසල් වල තිබෙන පුස්තකාල වලට ද මෙම සඟරාව නිකුත් කිරීමට පියවර ගන්නා ලෙස ද ඉල්ලා සිටිනලදී.

කුමාරගම සුසාන භූමිය නඩත්තු කිරීමට කම්කරුවකු යොදවා ඔහුට වැටුපක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

13:02 **ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, බළන්ගොඩ ආසනයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් කටයුතු කල ගරු මල්ලිකා රත්වත්ත මැතිණිය හා එම්.එල්.එම්.අබුසාලී මැතිතුමාගෙන් පසුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු මෙතෙක් පත්නොවුනු බැවින් , ප්‍රදේශයේ ජනතාවගේ අදහස් /යෝජනා/ගැටළු ආදියට විසඳුම් ලබාගැනීමට නොහැකිව ජනතාව අසරණ වී සිටින බව දැන්වීය.

නමුත් මෙවර පැවැත්වෙන පාර්ලිමේන්තු මහා මැතිවරණයේ දී බළන්ගොඩ ආසනයට මන්ත්‍රීවරයෙකු පත්වනු ඇතැයි තමන් බලාපොරොත්තු වන අතරම, බලන්ගොඩ ආසනයෙන් ඉදිරිපත්වන අපේක්ෂකයින් දෙදෙනාට ජයග්‍රහණය කිරීමට ශක්ති ධෛර්යය ලැබේවා යි තමන් සුභාශිංසනය කරන අතර , එක්සත් ජනතා සංධානයට විශිෂ්ඨ ජයක් ලැබේවා යි ද සුභ ප්‍රාර්ථනය කරන ලදී.

13:03 **ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමාඃ**

ගරු මන්ත්‍රීතුමා කථාකරමින් , මෙවර පැවැත්වෙන පාර්ලිමේන්තු මහ මැතිවරණයට බළන්ගොඩ ආසනයෙන් අපේක්ෂකයින් දෙදෙනෙකු ඉදිරිපත් වන අතර , ඔවුන් දෙදෙනාට ජයග්‍රහණය කිරීමට වාසනාව , ශක්ති හා ධෛර්යය ලැබේවා යි සිය සුභපැතුම් එක්කරන බව පවසන ලදී.

වසර 33 ක් වැනි කාලයක් බළන්ගොඩ ආසනයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පත්නොවුන බැවින් , බළන්ගොඩ ජනතාව සිය ප්‍රශ්ණ /යෝජනා ඉදිරිපත් කිරීමට නොහැකිව අතරමං වී සිටි බව පැවසීය. කෙසේ වෙතත් , මෙවර පැවැත්වෙන මහා මැතිවරණයේ දී බළන්ගොඩ ආසනයට පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකු පත්වනු ඇතැයි තමන් විශ්වාස කරනු ලබන බව වැඩිදුරටත් කරුණු දක්වමින් පැවසීය.

**14. අවසානයඃ**

**ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාඃ**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන්ටත් , ලේකම් මහතාටත් සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු ප.ව. 02.30 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.